Business & Accounting Studies

60 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2015 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2015

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I, II**
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

01. මිනිස් අවශ්‍යතා සපුරාගැනීමට යොදා ගන්නා විවිධ ස්වරූප වුවමනා ලෙස හඳුන්වයි. මෙහි සඳහන් වන මූලික අවශ්‍යතාවයන් වන්නේ,
1. ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍යය, ආරක්ෂාව
2. ආහාර, ධාන්‍ය ආහාර, ශාක ආහාර, මාංශ ආහාර, මත්ස්‍ය ආහාර
3. නිවාස, අන්තර් ජාලය, ගුරුවරු, පාසල්, පොත්පත්
4. ආරක්ෂාව, ආහාර, නිවාස, වෛද්‍යවරු, රක්ෂණය, රැකියාව.

02. නිෂ්පාදනයේ අරමුණ මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමයි. නිෂ්පාදනයේ මූලික අංශ ලෙස වර්ග කළ විට,
1. නිෂ්පාදනය, වෙළෙඳාම, බෙදාහැරීම.
2. ප්‍රාථමික නිෂ්පාදනය, ද්විතීයික නිෂ්පාදනය, තෘතීය නිෂ්පාදනය.
3. භාණ්ඩ, සේවා, බෙදාහැරීම.
4. කෘෂි නිෂ්පාදනය, ධීවර නිෂ්පාදනය, ඉදිකිරීම්.

03. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය යනු ව්‍යාපාරයට සමීප පරිසරයයි. අභ්‍යන්තර පරිසර සාධක ව්‍යාපාරයට සෘජු බලපෑම් ඇති කිරීමට සමත් වේ. මෙහි සඳහන් වන අභ්‍යන්තර පරිසර සාධකයකි.
1. අන්තර් ජාතික සම්බන්ධතා
2. දේශපාලන ප්‍රතිපත්ති
3. උද්ධමන අනුපාතය
4. ගනුදෙනුකරුවෝ

04. "ව්‍යාපාර වලින් තොර සමාජයේ පැවැත්මක් නැත." එයට හේතුව ලෙස දැකිය හැක්කේ,
1. ව්‍යාපාර සමාජයේ බහුලව ඇති නිසා ය.
2. ව්‍යාපාර සීඝ්‍ර ලෙස වර්ධනය වී ඇති නිසා ය.
3. ව්‍යාපාර සමාජයේ අවශ්‍යතාවයක් බවට පත් වී ඇති නිසා ය.
4. ව්‍යාපාර වලින් සියලුම මිනිස් අවශ්‍යතා සපුරාලන නිසා ය.

05. රටක ක්‍රියාකාරිත්වය වේගවත් කිරීමේ අරමුණින් මහ බැංකුව විසින් පොලී අනුපාතය පහල දැමීම කිනම් පාරිසරික සාධකයකට අයත් වේ ද?
1. දේශපාලන පරිසරය
2. නීතිරීති
3. ආර්ථික පරිසරය
4. ප්‍රජාව

06. ව්‍යපාර සැලැස්මක අන්තර්ගත නොවන්නේ,
1. අලෙවි සැලැස්ම
2. මෙහෙයුම් සැලැස්ම
3. මූල්‍ය සැලැස්ම
4. කළමණාකරණ සැලැස්ම.

07. 2007 අංක 7 දරණ සමාගම් පණත අනුව සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කිරීමේදී සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ප්‍රධාන ලියවිල්ල,
1. සංස්ථාපන සහතිකයයි.
2. සංගාමික සංස්ථා පත්‍රයයි.
3. සංස්ථා ප්‍රකාශයයි.
4. සාංගමික ව්‍යවස්ථාවලියයි.

08. සමිති සංවිධාන ලියාපදිංචි කිරීමට අදාළ පනත වන්නේ,
1. 1972 අංක 5 දරණ පනත 2. 1918 අංක 6 දරණ පනත
3. 2007 අංක 7 දරණ පනත 4. 1890 හවුල් ව්‍යාපාර පනත.

09. සුවිශේෂ ව්‍යාපාර සඳහා බලපත්‍රයන් ලබා ගැනීම අනිවාර්ය වේ. මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍රයක් ලබා ගත යුතු ව්‍යාපාරයක් වන්නේ,
1. කර්මාන්තශාලා 2. මුද්‍රණාලය 3. බේකරි 4. රියදුරු පුහුණු පාසල්

10. තැන්පතු භාර නොගන්නා ආයතන පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
1. වාණිජ බැංකු, කල්බදු සමාගම්, ඉතිරිකිරීමේ බැංකුව
2. සණස බැංකුව, කල්බදු සමාගම්, ඉතිරිකිරීමේ බැංකුව
3. වනික් බැංකුව, කල්බදු සමාගම්, මුදල් තැරැව්කාර ආයතන.
4. වනික් බැංකුව, කල්බදු සමාගම්, සංවර්ධන බැංකුව.

11. චෙක්පතක් පිටසන් කිරීම යනුවෙන් අදහස් කරන්නේ,
1. චෙක්පතේ සඳහන් ආකාරයට චෙක්පත පිටුපස ආදායකයාගේ නම ලිවීම.
2. චෙක්පත පිටුපස අණකරුගේ නම ලිවීම.
3. චෙක්පත පිටුපස ආදායකයාගේ අත්සන යෙදීම.
4. චෙක්පතේ පිටුපස අණලද්දා අත්සන් කිරීම.

12. අන්තර් බැංකුකරණය යනුවෙන් අදහස් කරන්නේ,
1. විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ගනුදෙනුකරුවන්ට මුදල් ලබා ගත හැකි වීම.
2. විවිධ වාණිජ බැංකු එක්ව එකම ජාලයකට සම්බන්ධව ගනුදෙනු කිරීමට පහසුකම් සැලැස්වීම.
3. එකම බැංකුවක ශාඛා කිහිපයක් එකට සම්බන්ධව තිබීම.
4. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් ගනුදෙනු කිරීමට පහසුකම් සැලැස්වීම.

13. වාණිජ බැංකුවකින් ලබා ගත හැකි සේවාවක් නොවන්නේ,
1. තැන්පතු ආශ්‍රිත සේවා 2. විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවා
3. කල්බදු සේවා 4. ප්‍රවාහනය සම්බන්ධ සේවා

14. සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක පවත්වාගෙන යන අස්වින් ට තම ගනුදෙනු පහසුකර ගැනීමට ජංගම ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය වී ඇත. ඒ සඳහා ඔහු යා යුත්තේ,
1. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව වෙත ය. 2. සබරගමු සංවර්ධන බැංකුව වෙත ය.
3. සම්පත් බැංකුව වෙත ය. 4. ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතය.

15. නුවරඑළියේ සිට එළවළු තොගයක් කොළඹ තොග වෙළෙඳ පොලට සහ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට ගෙනයාමේ දි ව්‍යාපාරිකයා විසින් සැලකිල්ලට ගනු ලබන සාධක ඇතුලත් නොවන්නේ,
1. පිරිවැය සහ ධාරිතාව 2. ලාභය හා වේගය 3. ආරක්ෂාව සහ පිරිවැය 4. සුලභතාවය හා ප්‍රමාණය

16. වර්තමානයේ සන්නිවේදන මාධ්‍යයක් ලෙස ජංගම දුරකථනය බොහෝ ජනප්‍රිය වී ඇත. මෙයට ප්‍රබල හේතුවක් වී ඇතතේ,
1. පිරිවැය අඩු වීමයි. 2. එහා මෙහා ගෙන යා හැකි වීමයි.
3. ආරක්ෂාව හා පිරිවැය 4. සුලභතාවය හා වේගය.

17. ව්‍යාපාරිකයෙකුට ගබඩාකරණයේ ඇති වැදගත්කම විවිධ අයුරින් දැක්විය හැකිය. ඒ අනුව ගබඩාකරණයේ වැදගත්කම සඳහන් වන ප්‍රකාශය වන්නේ,
1. ඉල්ලුම සැපයුම සමතුලිතව පවත්වාගෙන යාමට නොහැකි වීමයි.
2. බෙදාහැරීමේ ක්‍රියාවලිය වරින්වර කරගෙන යාමට හැකිවීමයි.
3. තොග යල්පැනීම් අපතේ යාම් ආදිය සිදු නොවීමයි.
4. උත්සව කාලවලදී භාණ්ඩ සැපයුම අඩුකල හැකි වීමයි.

18. තම දරුවන් දෙමාපියන් සම්බන්ධව ජීවිත රක්‍ෂණ ඔප්පුවක් ලබා ගැනීමට තිරණය කරයි. මෙහිදී අදාල වන රක්‍ෂණ මූලධර්මය වන්නේ,
1. උපරිම විශ්වාසය 2. රක්‍ෂණ හිමිකම 3. හානිපූරණය 4. දායකත්වය

19. මූල්‍ය සමාගම් විසින් ඉටු නොකරනු ලබන කාර්යය වන්නේ,
1. මූල්‍ය තැන්පතු භාර ගැනීම, මුදල් ණයට ලබා දීම, කල්බදු පහසුකම් සැලසීම.
2. මුදල් ණයට දීම, කල්බදු පහසුකම්, ජංගම ගිණුම්පවත්වා ගෙන යාම.
3. දේපල වෙළෙදාම් කටයුතු, සුරකුම්පත් මිලදී ගැනීම, මුදල් ණයට දීම.
4. කුලීපිට ගැනුම්, දේපල වෙළෙදාම්, මුදල් ණයට දීම.

20. ණයකාඩ්පත් මගින් ගනුදෙනු කිරීම වර්තමාන ව්‍යාපාර ලෝකය තුළ බෙහෙවින් ජනප්‍රිය වී ඇත. එසේ වීමට බලපෑ සාධකයකි.
1. ව්‍යාපාරික අවධානම් වැඩිවීම. 2. ව්‍යාපාරික කටයුතු පහසු වීම සහ සරල වීම
3. ලිපිලේඛන භාවිත කිරීමට සිදුවීම 4. වැඩි සේවක පිරිසක් අවශ්‍ය වීම.

21. ව්‍යාපාරයක සම්පත් හා සම්පත් සපයන පාර්ශව වලට එම සම්පත් සම්බන්ධයෙන් ව්‍යාපාරයේ ඇති බැඳීම් පිළිබඹු කරන ගණිතමය ඉදිරිපත් කිරීම,
1. ගිණුම්කරණ ඒකක සංකල්පයයි. 2. ද්විත්ව සටහන් සංකල්පයයි.
3. ගිණුම්කරණ සමීකරණයයි. 4. ද්විත්ව සටහන් සමීකරණයයි.

22. ගිණුම් පොත්වල සටහන් කල හැකි ව්‍යාපාරික ගනුදෙනුවක් වන්නේ,
1. ව්‍යාපාරයට හොඳ ගොඩනැගිල්ලක් තෝරා ගැනීම
2. රු. 50,000ක වැටුපකට කලමණාකරුවෙකු බඳවා ගැනීම.
3. ව්‍යාපාරයේ කීර්තිනාමය තක්සේරු කිරීම.
4. රු. 10,000 ක බැංකු ණයක් ලබා ගැනීම.

23. ව්‍යාපාරයේ අයිතිකරුගේ හිමිකම දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
1. වත්කම් - වගකීම් 2. වගකීම් + වත්කම්
3. වත්කම් + ප්‍රාග්ධනය 4. ජංගම වත්කම් + ජංගම නොවන වත්ක්ම්

24. ගිණුම්කරණ සමීකරණයේ එක් පැත්තකට පමණක් බලපාන ගනුදෙනුව වන්නේ,
1. ණයට භාණ්ඩ ගැනීම. 2. බැංකු ණයක් ගැනීම.
3. අයිතිකරුගේ ගැනිලි 4. අත්පිට මුදලට මෝටර් රථයක් ගැනීම.

25. නිෂ්පාදනය කර බෙදාහැරීමේ ව්‍යාපාරයක භාණ්ඩ තොගයක විකුණුම් මිල රු. 80,000කි. විකුණුම් මිල තීරණය කරන්නේ පිරිවැයට 25%ක ලාභයක් එකතු කිරීමෙනි. නිෂ්පාදනය කළ භාණ්ඩ ඒකක ප්‍රමාණය 8000 ක් නම් ඒකකයක පිරිවැය වන්නේ,
1. රු. 8 කි. 2. රු. 10 කි. 3. රු. 7.50 කි. 4. රු. 9 කි.

26. ආපසු එවුම් සටහන් කිරීමට භාවිත කරන මූලික ලියවිල්ල වනුයේ,
1. හරපත 2. ඉන්වොයිසිය 3. බැරපත 4. චවුචරය

27. එක්තරා ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය රු. 1,000 කි. මාසය තුළ වියදම් කර ඇති මුදල රු. 755 කි. ප්‍රතිපූරණයට අවශ්‍ය මුදල කීයද ?
1. රු. 1,000 කි. 2. රු. 755 කි. 3. රු. 245 කි. 4. රු. 1245 කි.

28. විකුණුම් ජනලයේ එකතුව මාරු කරනුයේ,
1. විකුණුම් ගිණුමේ හරට ය. 2. දෛනික විකුණුම් පොතේ බැරට ය.
3. ණයගැති පාලන ගිණුමේ බැරට ය. 4. විකුණුම් ගිණුමේ බැරට ය.

29. පොදු ජනලයේ සටහන් කරන ගනුදෙනුවක් නොවන්නේ,
1. ජංගම නොවන වත්කම් ණයට ගැනීම. 2. මාරු සටහන්
3. වැරදි නිවැරදි කිරීමේ සටහන් 4. නැවත විකිණීමේ අරමුණින් ණයට ගැණුම්

30. ත්‍රීත්වතීරු මුදල් පොතේ ලද වට්ටම් තීරුවේ එකතුව ලෙජරයට පිටපත් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.
 1. ලද වට්ටම් ගිණුම හර, මුදල් ගිණුම බැර    2. ලද වට්ටම් ගිණුම හර, දුන්වට්ටම් ගිණුම බැර
 3. ණයහිමියෝ හර, ලද වට්ටම් ගිණුම බැර    4. ලද වට්ටම් ගිණුම හර, ණයහිමියෝ බැර

31. ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,
 1. මූලික පොත්වල නිවරද්‍යතාවය තහවුරු කර ගැනීමයි.
 2. ගනුදෙනුවල ගණිතමය නිවරද්‍යතාවය තහවුරු කර ගැනීමයි.
 3. ලාභාලාභ තහවුරු කර ගැනීමයි.
 4. වත්කම් හා වගකීම් වල අගය තහවුරු කර ගැනීමයි.

32. 2015 මාර්තු 31 මුදල් පොතේ බැංකු තීරුවේ වාසිදායක ශේෂය රු. 5,000 ක් විය. මුදල් පොතේ සඳහන් නොවූ ස්ථාවර නියෝග මත කර ඇති ගෙවීම් රු. 1,000 කි. නිකුත් කර ඇති නමුදු ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් වල අගය රු. 3,000 කි. මේ අනුව සංශෝධිත මුදල් පොතේ ශේෂය වන්නේ,
 1. රු. 6,000 කි.    2. රු. 7,000 කි    3. රු. 4,000 කි.    4. රු. 1,000 කි.

33. මේ අනුව බැංකු ප්‍රකාශණයේ ශේෂය වනුයේ,
 1. රු. 5,000 කි.    2. රු. 7,000 කි.    3. රු. 3,000 කි.    4. රු. 9,000 කි.

34. රු. 45,000ක් වටිනා යන්ත්‍රයක් මිලට ගන්නා මෙම ගනුදෙනුව සටහන් කරන මූලික පොත වන්නේ,
 1. මුදල් පොත    2. පොදු ජනලය    3. ගැණුම් ජනලය    4. සුළු මුදල් පොත

35. රු. 20,000ක් වටිනා බඩු තොගයක් නුවන්ගෙන් ලබාගත් විට,
 1. වත්කම් රු. 20,000 කින් වැඩි වී වගකීම් රු. 20,000 කින් අඩුවේ.
 2.. වත්කම් රු. 20,000 කින් අඩු වී වගකීම් රු. 20,000 කින් අඩු වේ.
 3. වත්කම් රු. 20,000 කින් වැඩි වී තවත් වත්කමක් රු. 20,000කින් අඩු වේ.
 4. වත්කම් රු. 20,000 කින් වැඩි වී වගකීම් රු. 20,000 කින් වැඩි වේ.

36. සංශෝධිත මුදල් පොත සකස් කිරීම සඳහා යොදා ගන්නේ,
 1. තැන්පත්කළ උපලබ්ධි නොවූ චෙක් - බැංකු ගාස්තු - ස්ථාවර නියෝග මත ගෙවීම්.
 2. බැංකු ගාස්තු - සෘජු ප්‍රේෂණ - ස්ථාවර නියෝග මත ගෙවීම්.
 3. නිකුත් කළ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් - සෘජු ප්‍රේෂණ - බැංකු ගාස්තු
 4. තැන්පත් කළ උපලබ්ධි නොවූ චෙක් - නිකුත් කළ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් - බැංකු ගාස්තු

37. බැංකු ගිණුම් ප්‍රකාශයේ ශේෂයත් මුදල් පොතේ බැංකු ගිණුමේ ශේෂයත් අතර වෙනසක් ඇති වීමට බලපාන ගනුදෙනුවකි,
 1. ලබන ලද වට්ටම් රු. 2,000 ක් එම ගිණුමේ දෙවරක් සටහන් වීම.
 2. ණයගැතියකුගෙන් ලැබුණ රු. 5,000ක චෙක්පතක් මුදල් පොතේ සටහන් නොකිරීම.
 3. විදුලිය ගාස්තු ගෙවූ රු. 10,000 ක චෙක්පත් නැති වීම.
 4. ණයහිමියන්ට රු. 5,000 ක් ගෙවීම.

38. අවිනිශ්චිත ගිණුම හර රු. 5,000 - සඳුන්ගේ ගිණුම බැර රු. 5,000. මෙම පොදු ජනල් සටහන මගින් නිවැරදි කර ඇති වරද වන්නේ,
 1. සඳුන්ට ගෙවූ රු. 500 ඔහුගේ ගිණුමේ වැරදි පැත්තේ සටහන් වීම.
 2. සඳුන්ගෙන් ලද රු. 2,500 ඔහුගේ ගිණුමේ වැරදි පැත්තේ සටහන් වීම.
 3. සඳුන්ට ගෙවූ රු. 2,500 ඔහුගේ ගිණුමේ වැරදි පැත්තේ සටහන් වීම.
 4. සඳුන්ගෙන් ලද රු. 5,000 ඔහුගේ ගිණුමේ වැරදි පැත්තේ සටහන් වීම.

39. ලී අලුත්වැඩියාව සඳහා ගෙවූ රු. 1,000 ලී බඩු ගිණුමට හර කිරීම.
 1. හිලව් දෝෂයකි.    2. අතිරික්ත දෝෂයකි.    3. මූලධර්ම දෝෂයකි.    4. ද්විකරණ දෝෂයකි.

40. රු. 5,400ක ණයගැති ගිණුමේ ශේෂය ඉදිරියට ගෙන යාමේ දි රු. 4,500ක් ලෙස ඉදිරියට ගෙනයාම,
 1. ද්විකරණ දෝෂයකි.    2. අතිරික්ත දෝෂයකි.    3. ඌනතා දෝෂයකි.    4. හිලව් දෝෂයකි.

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.